1 වන පිටුවෙන්

## 13 වෙනි සංශෝධනය හෙවත්...විනාසයට පාර ක්‍රියාවට නැගීම

පළාත් සභා දිවයිනේ පළාත් නමයේම පිහිටුවා ලූ අතර ඒ වන විට උග්‍රවී තිබුණු කොටින් ප්‍රමුඛ ද්‍රවිඩ විරෝධය ද සමනය කිරීමේ උපක්‍රමයක් ලෙස උතුරු සහ නැගෙණහිර පළාත් දෙක ඒකාබද්ධ කොට, ඒකාබද්ධ කළ එක් සභාවක් පිහිටුවීමද හදිසි නීතිය යටතේම කෙරිණ. මෙම මෝඩ තකතිරු අදූරදර්ශී පියවරෙන් එවකට කොටින් සහ වෙනත් ද්‍රවිඩ පක්ෂ සිතියම්වල පවා දක්වමින් ප්‍රචාරයට පත්කර තිබුණු ඊනියා ද්‍රවිඩ නිජබිම් සංකල්පය නමැති බෙදුම්වාදී පිළිවෙත නිලවශයෙන් පිළිගැනීමක් විය. මේ දේශද්‍රෝහී බන්ධනය ලිහන ලද්දේ වසර 20 ක් පමණ ගත වී, ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛව දේශ හිතෛෂීන් විසින් පවරණ ලද නඩුවකට මෑතකදී අපේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙනු ලැබූ උතුරු නැගෙණහිර වෙන්කරලන නඩු තීන්දුවකිනි.

ඒ පළාත් සභා ඡන්දය ශ්‍රීලංකා නිදහස් පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ විසින් වර්ජනය කරනු ලැබීය. පළාත් සභා හතකට රජයට ගැති අය පත්වූ අතර මහ ඇමතිවරුන්, ඇමති මණ්ඩල ආදියද ජේ.ආර්. රජය විසින් සකස්කරනු ලැබිණ. රජය ආණ්ඩුකාරවරුන් ද පත් කළා ය. උතුරු නැගෙණහිර මහ ඇමති වශයෙන් පත්කරගත් වර්ධරාජා පෙරුමාල් නමැති පුද්ගලයා නීති විරෝධී ලෙස එහි ද්‍රවිඩ රාජ්‍යයක් ප්‍රකාශයට පත්කොට ඉන්දියාවට පැනගියේ ය. උග්‍රවෙමින් පැවති කොටින්ගේ විරෝධතා සටන් යටතේ උතුරු නැගෙණහිර පළාත් සභාවේ අවසානයද එය විය.

මේ පළාත් සභා ක්‍රමය අනෙක් ප්‍රදේශ හතේ දැන් වසර විස්සකට වඩා පැවතී ඇත. ආණ්ඩුකාරවරු, මහ ඇමතිවරු, ඇමති මණ්ඩල ඇමතිවරු, පළාත් සභිකයන්, නිලධාරිමණ්ඩල, යාන වාහන, කායාීල ආදී මේ දේවල් පවත්වාගෙන යාමට රජයෙන් වෙන්වන මුදල් සහ වරිපණම් බදු ආදියෙන් එකතුවන මුදල් විශාල ප්‍රමාණයක් වැයවේ. දූෂණ, පගාව, කොමිෂන් ආදී සියල්ලට මුදල් වෙන්වූ පසු මහජන සේවාවන්ට ඉතුරුවන්නේ සොච්චමකි. අද මේ පළාත්සභා මහා පරිමාණයේ මහජන මුදල් නාස්තියක් බවට පත්ව ඇත.

මුලදී යෝජනාවූ සංශෝධන යටතේ පළාත්වල පොලිස් බලතල, උසාවි ඇතුළු නීතිමය සංවිධාන බලතල විමධ්‍යගත කොට පළාත් සභාවලට පැවරීමට යෙදී තිබුණි. කෙසේ වුවද උතුරු නැගෙණහිර ප්‍රදේශවල මතුවූ තත්වයන් නිසාද, දකුණු ප්‍රදේශවල දේශ හිතෛෂී ජනතා විරෝධය නිසාද එම අංශ ක්‍රියාවට නගන්නට රජය පසු බැස්සේය. දශක දෙකක අත්දැකීම් මත නිගමනය කළ හැක්කේ ජේ. ආර් ගේ ව්‍යවස්ථාව මෙන් ම, බලය බෙදාලීමේ පළාත් සභා ක්‍රමය ද අතිශය දේශද්‍රෝහි, අසාර්ථක පියවරක් වූ බවයි.

### දැන් පවතින තත්වය

දැනට වාර්තාවන පරිදි කොටි ත්‍රස්තවාදීන්ට විරුද්ධව අප විරෝදාර හමුදාවන් සටන දිගටම සාර්ථකව ඉදිරියට ගෙනයමින් තිබෙන අතර, උතුරේ ප්‍රදේශ රාශියක තිබුණු කොටි කඳවුරු බිඳහෙළමින් උන් පළවා හැර, සටන තීරණාත්මක තැනකට ගෙන අවුත් ඇත. ඉතා නුදුරු අනාගතයේදී ම කොටින්ගේ පරාජය නොවැලැක් විය හැකි බව විමර්ශකයෝ ප්‍රකාශ කරති. මේවා කියන්නේ අප නොවේ. ඒ කියනු ලබන්නේ ලෝකයේ පවතින ගැටුම් විමර්ශනයේ නිරතුරුවම යෙදී වාර්තාකරන **London** හි **Jane's Intelligence Review** නමැති ලොව පිළිගත් ආයතනය දැනට සති දෙකකට පෙර නිකුත් කළ වාර්තාවක් මගිනි.

එය මෙසේය:

රජයේ ගුවන් ප්‍රහාර වලින් ලබා ඇති ප්‍රබල මට්ටම නැගෙණහිර ප්‍රදේශයේ ජයග්‍රහණයට තීරණාත්මක වූවාසේම, දැන් උතුරේ සටනටද ජයග්‍රහණයට නිසැකවම තුඩුදෙන බවත්, වයඹ වෙරළේ ලබා ඇති ජය සඳහා ද එම ගුවන් ප්‍රහාර උදව් වූ බවත්, වයඹ වෙරළ අහිමිවීම නිසා ආයුධ හා සාමාජිකයන් වන්නි සටනට ලබාගැන්ම ද කොටින්ට අසීරු වී ඇති බවත් එම වාර්තාවේ දැක්වේ. එය මෙසේ ද කියයි.

“ රටේ දකුණු ප්‍රදේශවල කොටි ගෙනයන බෝම්බ පිපිරවීම් වලින් රජයේ හමුදාවන් උතුරේ සටන් භූමියෙන් ඉවතට ඇදගන්නට කොටින්ට බැරිවිය. කොටින්ගේ පෙරටු කඳවුරු බිඳහෙලමින් ශ්‍රීලංකා රජයේ හමුදාවන් 2008 මැද භාගය වන විට **A32** මාර්ගය දිගේ උතුරට පිවිසීම වැළැක්විය හැකි නොවේ. කොටින්ගේ නමට පමණක් පවතින ‘ගුවන් හමුදාවට’ ප්‍රායෝගික සටන්වලට මුහුණ දීමට බැරිය. ඔවුන්ගේ තිබුණු මුහුදු බලකාය විනාශකර ඇති බැවින් මුහුදේ බලයක්ද දැන් කොටින්ට නැත. එසේම අවි ආයුධ පිටින් ලබාගැනීමේ හැකියාව වැළකී ඇත. අළුතින් කාඩරයන් බඳවාගැනීමද අසීරුවී තිබේ. පිටරටවලින් වැටී ඇති තහනම් නිසා මුදල් රැස් කර ගැන්මද, ආයුධ ලබාගැන්මද වැළකී ඇත.”

ඉහතකී විමර්ශනය අවසානයේ එම වාර්තාව පහත දැක්වෙන ඉතා වැදගත් ප්‍රකාශය කරයි. එනම්:

**“ වෙනත් යුදමය හෝ දේශපාලනමය හෝ බාහිර අත දැමීමකින් හෝ මේ දැන් ඇති තත්වයට බලපෑමක් සිදු නොවුන හොත්, එල්ටීටීඊයේ බලය ක්ෂය වී, ඔවුන්ට පරාජයකට මුහුණ දෙන්නට සිදුවීම කිසිසේත් වැළැක්විය නොහැකි ය.”**

කොටි ත්‍රස්තවාදීන් අද වැටී ඇති තත්වය මෙයින් මනාව පැහැදිලි වේ. දැන් ලංකා රජය මේ **13** වෙනි සංශෝධනයක් ගෙනැවිත් කරන්නට හදන්නේ වැටීගෙන යන කොටියාට ජීවන හුස්ම පිඹීමක් හෙවත් ඔක්සිජන් දීමකි. අර ඉහත ප්‍රකාශයේ අවධාරණය කරන දේශපාලනමය තත්වය අපේ මෝඩ තකතිරු මොට්ට දේශපාලයින් විසින් ම සපයාදෙන්නට යනවා නොවේද?

මෙම බහුබූත සර්වපාක්ෂික **13** වන සංශෝධන යෝජනාවලියට සිය පූර්ණ සහයෝගය දෙන බවට රනිල් වික්‍රමසිංහ මහතාද ජනාධිපතිවරයාට අතට අත දෙමින් පොරොන්දු වී ඇත. ඊනියා සටන් විරාම ගිවිසුම නමැති මර උගුල අටවා මොහු ජාතියට කළ විනාශයෙන් අප ජාතිය ගොඩ ආවේ වසර 6 ක් ගතවී ඉමහත් පරිශ්‍රමයකිනි. දැන් මෙම ද්‍රෝහී පුද්ගලයා මෙයට සහායදෙන විටම එම අනතුරු සඥාව අප ජනතාව හඳුනා ගත යුතුය. දැන් රනිල් හදන්නේ සිය ජේ. ආර්. මාමා ජාතියේ ගෙල සිඳීමට දංගෙඩියට ගෙන යාමට 21 වසරකට පෙර ආරම්භ කළ ක්‍රියාවලිය දැන් රට කරනවුන් ලවාම කරවා සම්පූර්ණ කිරීමටය.

**13** වෙනි සංශෝධනය ක්‍රියාත්මක කරනවිට පොලිස්, උසාවි, ඉඩම් බලතල රජයේ වියදමින්ම කොටින්ට ලැබෙනු ඇත. එවැනි බලතල නැතිවත් පසුගිය කාලයේ මුන් කළදේ රජයේ අයට කෙසේ වෙතත් අපට මතක තිබේ. එනිසා අපි රජයට මෙසේ කියමු.

**වරක් වැටුණු වලේ ආයිත් වැටෙන්න එපා!**

**13 වෙනි සංශෝධනය ඇතුළු සර්ව පාක්ෂික යෝජනා ඉරාදමනු!**

**ත්‍රස්තවාදය මුලින්ම උදුරා දමනු !**

**සිංහළ දෙමළ මුස්ලිම් ආදි සකල ලක් ජනතාවම මෙම තීරණාත්මක මොහොතේ කොටි ව්‍යසනයෙන් මුදාලනු !**

# දකුණු ලක පාසැල් දරුවන්ට පිහිටවන එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනම

## මාස්මුල්ලෙ අපටත් මිරිවැඩි සඟලක්





මේ අපේ හොඳම පන්ති කාමරයයි



අපට සපත්තු ලැබුණා, අයිස්ක්‍රීම් එකකුත් ලැබුණා

**මා**තර කඹුරුපිටියේ, මාස්මුල්ල පාසැලට ඉර පැයුවේ වෙනදා වාගේමයි. සිහින් ලා හිරු රැස් මූකලාන පාසැල උඩින් විහිදුනේ ආශීර්වාද කරන්නාක් වගේ. පාසැලේ දරු දැරියන් සුදු වතින් සැරසී එහාට මෙහාට දුවන්නෙ හරියට කඩිගුලක් ඇවිස්සුණා වාගේ.

ගමේ කැලෑවෙන්, වත්තේ පාත්තියෙන් කඩාගත් මල් පොකුරු, කොළ අතු, ජෑම් බෝතල්, හෝර්ලික්ස් බෝතල් වලට වැටුණේ අපූරු මල් බඳුන් සපයමින්.

පන්ති කාමරය පුරා තිබුණු ඩෙස්ක් බංකු පන්තියේ කොනකට කෙරුණේ මැද හැදී ඇති වලවල් මනාවට නිරූපණය වෙමින්. අනේ මේ වලවල් මෙහෙම නැතුව මේ තැන්වල සිමෙන්ති තිබුණා නම්.... ළමුන් කී දෙනෙකුට එහෙම සිතෙන්නට ඇද්ද? “ ළමයි ඉක්මන් කරන්න අමුත්තො පැමිණෙන වෙලාව ළං වෙනවා.” ඒ පන්තිය භාර ගුරුතුමියගේ හඬයි.

කලු ලෑල්ල ඉදිරියෙ ඇති ගුරු මේසය වෙනදාට වඩා කොතරම් අලංකාරද? පිරිසිදුනැවුම් මේස ඇතිරිල්ල, මල් පෝච්චිය ගෙනදුන්නේ කියා නිම කළ නොහැකි අලංකාරයක්. මේසය ඔබ්බට වෙන්නට තියා තිබුණු පුටු මුළු පාසැල පුරාවෙන්ම සොයාගත් හොඳම පුටු දහයයි.

“ අන්න කට්ටිය එනවා...” සිසුවෙක් එසේ කෑගැහුවෙ පාසැලේ කඩුල්ල ගාව නතරවුණු නවීන පන්නයේ වාහනයක් දැකලයි. “ ළමයි දැන් සේරමලා සද්දෙ නවත්තලා පෙළට හිටගන්න. ඒ මහත්තුරු ආවහම ලස්සනට හොඳට ශබ්ද නගලා පිළිගැනීමේ ගීතය අපි පුරුදුවුණු විදියට කියන්න ඕන. ” ඒ පන්තිභාර ගුරුතුමීගේ අණයි.

කහපැහැයට හැරී දිරාපත්වුණු පාසැල් ඇඳුමුත්, පාවහන් නොමැති දෙපාත්, ඔවුනගේ මුහුණේ නැගී තිබූ ප්‍රභාවට බිඳකුදු බාධාවක් නොවුණේ ය.

මුල්ගුරුතුමා පෙරදැරිකරගෙන ආ අමුත්තන් ළමයින්ට පෙනුණේ සුරලොවින් ආ දේවදූතයන් ලෙසයි. “ මොනවද අර පෙට්ටි? ” එකෙක් ඇසුවේ ඇසෙන නෑසෙන හඬින්. “ ඒ තමයි අපේ තෑගි ” පිළිතුරු දුන්නේ තවකෙක්. ඉතා අලංකාර පෙට්ටි විශාල ප්‍රමාණයක් ශාලාවේ කොණක තිබුණු මේසයකට පෙළ ගැසිණ. ළමයින්ගේ සිහින ලෝකය බිඳිමින් පන්ති භාර ගුරුතුමියගේ අතේ තිබුණු තාලම් පොට හඬ වැදුණේ තාලයට.

එකිනෙකා පරයමින් ශබ්ද නගා තාලයට කියැවුණු ඒ පිළිගැනීමේ ගීතය ඉතාමත් මනරම්. පිළිගැනීමේ ගීතයෙන් පසු අමුත්තන් අසුන්ගත් පසු පසුපසට වෙන්නට තිබුණු බංකු පේලි වල ළමුන් අසුන් ගත්තේ සීරුවට වගේ.

මුල්ගුරුතුමා එක්ක අමුත්තන් වාඩිවී සිටි තැනම එල්ලා තිබුණු බැනරය ලෙලදුන්නේ ලතාවකට. **එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනම** යනුවෙන් ඒ ලියා තිබූ වදන් උත්සව ශාලාවට ගෙන දුන්නේ තවත් අලංකාරයක්. මුල්ගුරුතුමා නැගිට අමුත්තන් පිළිගැනීමේ කතාව සිදු කළා.

ඒ කතාවෙන් වැඩිපුරම කියැවුණේ එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනම මගින් මාස්මුල්ල පාසැලේ දරුදැරියන්ට ඉගෙනුමට අවශ්‍ය පොත පත, පෑන් පැන්සල් හා පාවහන් පරිත්‍යාග කිරීම ගැන ඒ ගුරු මණ්ඩලයද, දරු දැරියන්ද, ඔවුන්ගේ දෙමාපියන්ද ඒ පදනමට කෘතඥ වන බවයි.

ඉන් අනතුරුව ගාලු මිතුරු පදනමේ සභාපති යටියන ගමගේ මහතා අතින් ඒ පාසැල් දරුවන්ට සපත්තු පෙට්ටිය බැගින් පිරිනැමුණා. ඒ තෑගි අතට ගත් දරුවන් ඒ පෙට්ටි තුරුලු කරගත් ආකාරයත්, ඒ සමග ඔවුන්ගේ මුහුණේ නැග ආ සොම්නසත් දුටු කෙනෙකු ගේ සිත සසල කරවන්නක් බව කිව යුතුයි. ඒ දරුවන් බොහෝ දෙනෙක් පාසැලට පාවහන් පළ දින අය නොවෙයි. මන්ද පාවහන් සඳහා ඔවුනට මුදල් නැති නිසා. ඊට පසු තවත් පරිත්‍යාගයක්. එනම් මාස්මුල්ල පාසැලට පරිගණක යන්ත්‍රයක් ද තෑගි දුන්නා. ඉතා ළඟදීම පාසැලට අංග සම්පූර්ණ පුස්තකාලයක් ද එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනම මගින් සම්පාදනය කෙරෙන බව ද සභාපති ගමගේ මහතා එහිදී පැවසුවා. ඉමදුව කඹුරුපිටිය හවුපේ ආදී ප්‍රදේශ කීපයකම පාසැල්වලට ද මාස්මුල්ල පාසැලට වාගේම උපකරණ පරිත්‍යාග කර තිබෙන බව ද කියැවුණා.

එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනමේ නිර්මාතෘ එංගලන්තයේ කෙන්ට් ප්‍රාන්තයේ වෙසෙන ශ්‍රීලාංකික ඉන්ජිනේරුවෙකු වන දෙව්සිරි හේවාවිදාන මහතායි. ඒ මහතා එක්සත් රාජධානියේ වෙසෙන තම ඉංග්‍රීසි මිතුරන් පිරිසක් ද එකතුකරගෙන ලංකාවේ ගම්බද දිළිඳු පාසැල් දරුවන්ට උදව් උපකාර කිරීමේ අවංක චේතනාවෙන්ම ආරම්භ කළ ගාලු මිතුරු පදනම අද ඒ මග බොහෝ දුර ගිහින්. ශ්‍රීලංකාවේ කටයුතු සියල්ල ඇප කැප වී ඉටුකෙරන්නේ දෙව්සිරිගේ පවුලේ සාමාජිකයන් අතින්.

දරුවන්ගේ පාසැල් අධ්‍යාපනයට ආධාර කරනවාට අමතරව පදනම මගින් පසුගිය කාලයේ සුනාමියෙන් අවතැන්වූ අයට ගෙවල්ද සාදා දී ඔවුන් පදිංචි කරවා තිබෙනවා.

දකුණේ පාසැල් කීපයකම තෝරාගත් දිළිඳු ශිෂ්‍යයින් වෙනුවෙන් ශිෂ්‍යත්ව 150 ක් ප්‍රදානය කර ඇති අතර තවත් 50 දෙනෙකු ශිෂ්‍යත්ව අපේක්ෂා වෙන් සිටින බව අපට දැනගන්නට ලැබුණා.

කොළඹ ආනන්ද විද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යයෙකු වන දෙව්සිරි හේවාවිදාන මහතා දක්ෂ ලේඛකයෙකුද වෙනවා. ඔහු ලියන සිංහළ ලිපි ශ්‍රී ලංකාවේ ඉරිදා ලක්බිම පත්‍රයේ නිතර පළවෙනවා.

දෙව්සිරි නිතර කියන දෙයක් “ තමා උපන්, අධ්‍යාපනය ලැබූ, එමෙන්ම තම නෑදැයින් වෙසෙන, තම මව්බිමට සේවයක් කරන්නට බැරිනම් ඉතින් ඇති වැඩක් නෑ” යනුවෙන්. ඒක ඇත්ත.

එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනම හා සම්බන්ධ වෙන්න ඔබත් කැමති නම් මෙන්න එහි වෙබ් අඩවිය.

**www.ukfg.net**

මව්බිමෙන් බැහැරව දේශ දේශාන්තරවල පදිංචි ලක්ෂ ගණනක් ශ්‍රීලාංකිකයො ඉන්නවා. ඉන් ඉතා ටික දෙනෙක් තම උපන් භූමියට උදව් කරනවා. අනෙක් විශාල කොටසක් මව්බසත්, හැදියාවත්, නෑදෑ මිතුරනුත් අමතක කරලා. නමුත් ඒ අය ඒ තැන්වල ඉන්නෙ මව්බිමෙන් ලැබුණු ජීවය නිසා. ගාලු මිතුරු පදනම ඒ කාටත් ආදර්ශයක් වේයයි මම හිතනවා.

♦ **ලුම්බිණි විතාන** **Langley UK**